බැංකු ඇපකර හෝ බැඳුම්කර, පොරොත්තු ණයවර ලිපි සහ සංස්ථාපිත බැඳුම්කර පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 01 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙන්දන් විසින් සිදු කරනු ලබන විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග (ප්‍රාග්ධන ගනුදෙනු පිළිබඳ නියෝග) සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 9(2) වගන්තිය ප්‍රකාරව, බැංකු ඇපකර, බැඳුම්කර, පොරොත්තු ණයවර ලිපි නිකුත් කිරීමට සහ අළුත් කිරීමටත් සංස්ථාපිත බැඳුම්කරවලට ආදාල ගෙවීම් සිදු කිරීමටත් පහත කරුණුවලට යටත්ව බලයලත් වෙළෙන්දන් වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවලට අවසරය දෙනු ලැබේ.

2. පාදක වූ ගනුදෙනුව, පනතේ ප්‍රතිපාදනයන් යටතේ ප්‍රදානය කර ඇති අවසර ප්‍රකාරව අවසරලත් ගනුදෙනුවක්ද යන වග තහවුරු කර ගැනීමට බලයලත් වෙළෙන්දන් වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සාක්ෂි ලබා ගත යුතුය.

3. නිකුත් කිරීමට අපේක්ෂිත ඇපකරයෙන් පැන නැගිය හැකි අවිනිශ්චිත වගකීම දැරීමට සමාගමට ඇති මූල්‍යමය හැකියාව බලයලත් වෙළෙන්දන් වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ඇගයීමට ලක් කොට තහවුරු කර ගත යුතුය.

4. පහත ඇපකරයන් නිකුත් කරන අවස්ථාවකදී,

4.1 අත්තිකාරම් ගෙවීම් ඇපකර:

අ. ඇපකරයෙහි වටිනාකම, ශ්‍රී ලංකාවේ වාසික පුද්ගලයාට ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයාගෙන් ලැබෙන අත්තිකාරම් ගෙවීම් වටිනාකමට සමාන හෝ අඩු විය යුතුය.

ආ. ශ්‍රී ලංකාවේ වාසික පුද්ගලයාගේ ශ්‍රී ලංකාව තුළ පවත්නා ගිණුම් වලට ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයාගෙන් අත්තිකාරම් ගෙවීමක් හිමි වීමෙන් පසුව පමණක්ම ඇපකරය වලංගු භාවයට පත්වන බවට කොන්දේසියක් ඇපකරයට ඇතුලත් කළ යුතුය.

4.2 කාර්යසාධන බැඳුම්කර: කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට අදාළ සාක්ෂි සහ එහි සඳහන් කොන්දේසි යන තහවුරුවන්ට යටත්ව නිකුත් කළ යුතුයි.

4.3 ලංසු බැඳුම්කර: ටෙන්ඩරයෙහි හෝ මිල කැඳවුමෙහි සඳහන් කොන්දේසිවලට යටත්ව නිකුත් කළ යුතුය.

5. බලයලත් වෙළෙන්දන් වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් බලයලත් වෙළෙන්දෙකු වශයෙන් වෙනත් බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් එම අරමුණ වෙනුවෙන්ම ඇපකරයක් ලබාගෙන නොමැති බවට අදාල සමාගමෙන් දිවුරුම් ප්‍රකාශයක් ලබාගත යුතුය.

6. බලයලත් වෙළෙන්දෙකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්, මෙම විධානයන්හි සඳහන් කර ඇති ලිපි ලේඛනවලට අමතරව සිදු කිරීමට අපේක්ෂිත පාදක වූ ගනුදෙනුවෙහි සද්භාවය සහ නීත්‍යානුකූලභාවය සනාථ කිරීමට සහ මෙම විධිවිධානවල දක්වා ඇති කොන්දේසිවලට දක්වන අනුකූලතාවය සහතික කිරීමට අවශ්‍ය නෛතිකව පිළිගතහැකි මනා ලිඛිතමය සාක්ෂි (අවශ්‍ය පරිදි) ලබා ගතයුතුය.

7. වලංගු හිමිකම්

7.1 පාදක වූ ගනුදෙනුවෙහි සද්භාවය පිළිබඳව සෑහීමකට පත් වීමෙන් අනතුරුව ඉහත සඳහන් කළ ගැසට් පත්‍රයෙන් අවසර දී ඇති බැංකු ඇපකර, බැඳුම්කර, පොරොත්තු ණයවර ලිපි සහ සංස්ථාපිත ඇපකරවලට අදාලව වලංගු හිමිකම් නිසා පැන නගින ප්‍රතිමුඛ ප්‍රේෂණ සිදු කිරීමටද බලයලත් වෙළෙන්දන් වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවලට අවසරය ලබා දෙනු ලැබේ.

7.2 ඇපකරයක උපරිම වලංගු හිමිකම් වටිනාකම පාදක වූ ප්‍රාග්ධන ගනුදෙනුවෙහි ඉතිරිව පවත්නා බැඳීමෙහි සමානුපාතිකය දක්වා සීමා විය යුතුය. ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් (ආයෝජකයා) වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගමක් (ආයෝජිතයා) සඳහා නිකුත් කර ඇති ඇපකරයක වලංගු හිමිකමක් පැන නැගුනු අවස්ථාවක, හිමිකමේ උපරිම වටිනාකම, එම හිමිකම බලපවත්නා අවස්ථාවේ ඉතිරිව පවත්නා බැඳීම ආයෝජකයා විසින් ආයෝජිතයාගේ දරන කොටස් හිමිකමේ ප්‍රතිශතයට සමානුපාතික හෝ අඩු විය යුතුය.

8. විදේශ විනිමය දෙපාර්තමේන්තුවට වාර්තා කිරීම

ඇමුණුම 01 ට අනුව ප්‍රාග්ධන ගනුදෙනු පිළිබඳ නියෝගයන් මගින් අවසර දී ඇති පරිදි බලයලත් වෙළෙන්දෙකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිකුත් කරන ලද ඇපකරවල කාර්තුමය වාර්තාවක් එළඹෙන මාසයේ 15වන දින හෝ ඊට පෙර යොමු කළ යුතුය. (පරිලෝකන පිටපත dfem@cbsl.lk හරහා යොමු කළ යුතුය.)

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ඇමුණුම 1

ඇපකර පිළිබඳ වාර්තාව

බලයලත් වෙළෙන්දාගේ නම : .....

වර්ෂය/කාර්තුව : .....

1. ඇපකර

නිකුත් කළ ඇපකර ගණන	කල් පිරුණු ඇපකර ගණන	ඉතිරි වටිනාකම

2. හිමිකම් යටතේ කරන ලද ප්‍රතිමුඛ ප්‍රේෂණ පිළිබඳව විස්තර

ආයතනයේ නම	ප්‍රේෂණයේ දිනය සහ වටිනාකම	හිමිකමෙහි ස්වභාවය	ඇපකර වර්ගය (සංස්ථාපිත/අත්තිකාරම් ගෙවීම්/පොරොත්තු ණයවර ලිපි හෝ වෙනත්)

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික වෙමි.

.....

දිනය ..... බලයලත් නිලධාරියාගේ නම සහ අත්සන